වර්තමානයේදී වන සේවායෝජකයින් හෝ සේවායන්, අතීතයේදී හාම්පුතුන් ලෙසින්ද හැඳින්විණි. එය එසේ වුවත්, වර්තමානය වන විට වෙනස් වී ඇත්තේ හාම්පුතා යන යෙදුම පමණක් නොවේ. හාම්පුතා යන යෙදුමින් නියෝජනය වූ සමාජ සම්බන්ධතාවයද වර්තමානය වන විට වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයක් බවට පරිණාමය වී තිබේ. ඒ අනුව බලන විට, වත්මන් සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවය හා සැසඳීමේදී, හාම්පුතා යන්නෙන් වඩාත් පසුගාමී ස්වාමි-සේවක සම්බන්ධතාවයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් කෙරේ. අතීතයේ වූ 'ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය' පවා වර්තමානය වන විට 'ලංකා සේවා සම්මේලනය' බවට වෙනස් වී තිබේ.

එසේ නම්, පුවත් වාර්තාවන් තුළ හාම්පුතුන් යන යෙදුම් වෙනුවට වඩාත් යෝග්‍ය යෙදුම් ඉදිරිපත් වීමට මේ කාලය නොවේද? හාම්පුතා වැනි යෙදුමක් වෙනුවට සේවායෝජකයා හෝ සේවායා වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේද?

මව්බිම සහ අරුණ පුවත් කිහිපයක 'හාම්පුතුන්' යනුවෙන් සඳහන් වන අතර, ඊට සමාන තවත් මව්බිම පුවතක 'වැවිලිකරුවන්ගේ සමාගම්' යනුවෙන් යෙදී ඇති ආකාරය මෙහිදී නිරීක්ෂණය කළ හැක.

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Aruna